මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ දරුණුතම දඬුවමට ලක්වන්නේ අල්ලාහ්ගේ මැවීමකට සමාන යමක් කිරීමට උත්සාහ කරන්නන් වේ

දේව විශ්වාසීන්ගේ මෑණිය වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා
කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) මා වෙත පැමිණියහ. මා විසින් මගේ කුටියේ (දොරටුවට) මා සතු පින්තූර සහිත තිරයකින් ආවරණය කර තිබුණි. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) එය දුටු විට, එය ඉවත් කළහ. එතුමාණන්ගේ මුහුණේ වර්ණය ද වෙනස් විය. එතුමාණෝ: "අහෝ ආඉෂා! මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ දරුණුතම දඬුවමට ලක්වන්නේ අල්ලාහ්ගේ මැවීමකට සමාන යමක්
කිරීමට උත්සාහ කරන්නන් වේ." යැයි පැවසූහ. ආඉෂා තුමිය තවදුරටත්: 'අපි එය කෑලි කර ඉන්
එක් කොට්ටයක් හෝ කොට්ට දෙකක් සාදා ගත්තෙමු' යැයි පැවසුවාය.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය දැකීමට ඔහුගේ නිවසට ඇතුළු වූහ. එවිට, ඇය බඩු බාහිරාදිය තබා ඇති කුඩා අල්මාරිය සජීවී ජීවීන්ගේ රූප සහිත රෙදි කඩකින් ආවරණය කර ඇති බව එතුමාණන්ට පෙනී ගියේය. එවිට අල්ලාහ් වෙනුවෙන් එතුමාණන් කෝපයට පත්වී එතුමාණන්ගේ මුහුණේ වර්ණය ද වෙනස් වූ අතර එතුමාණන් එය ඉවත් කර මෙසේ පැවසීය. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ දරුණුතම දඬුවම් ලබන මිනිසුන් වනුයේ අල්ලාහ් මැවූ සජීවී හැඩරුවන්ට යමක් සමාන කිරීමට උත්සාහ කරන්නන් වෙති. ආඉෂා තුමිය තවදුරටත්: 'අපි එමගින් කොට්ටයක් හෝ කොට්ට දෙකක් සාදා ගත්තෙමු' යැයි පැවසුවාය.

http://www.sunnah.global/hadeeth/si/show/5931